Samith Alwis | A/L Economics 2020 –Samith Alwis | A/L Economics –2020 –Samith Alwis | A/L Economics 2020

ආර්ථික විද්‍යාව II
Economics II

Three hours
පැය තුනයි

**අ.පො.ස (උසස් පෙළ) විභාගය, ඔක්තෝම්බර්**

**G.C.E. (Adv.Level) Examination, 2020 Octomber**

"අ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද හා "ආ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## "අ" උප කොටස

1)

i. ''කිසියම් භාණ්ඩයක් පරිභෝජනය කරන විට ඒ සඳහා ඔබගෙන් මිලක් අය කරනු නොලැබේ නම් එම භාණ්ඩය ආර්ථික නොවන භාණ්ඩයක් විය යුතුය'' මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

ii. ''එක්තරා ආර්ථිකයක එක් භාණ්ඩයක නිෂ්පාදනය සමානුපාතිකව වැඩි කරන විට අනෙක් භාණ්ඩයේ කැප කරන ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි විය'' මේ සඳහා බලපෑ නීතිය කුමක්ද? ඒ සඳහා බලපාන හේතු මොනවාද? (ලකුණු 04 යි.)

iii. ශ්‍රමික විභාජනය, ආර්ථිකයක නිෂ්පාදන මට්ටම ඉහළ නැංවීමට හේතු වන්නේ ඇයි දැයි පැහැදිලි කෙරෙන හේතු 4ක් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

iv. පහත සඳහන් සංකල්ප නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර මගින් නිරූපණය කරන්න.

a. ආර්ථිකයකට විදේශ ආයෝජන ගලා ඒම.
b. දැනට භාවිතා නොවූ ශ්‍රම සම්පත් ප්‍රමාණයක් ආර්ථිකයේ පැවතීම.
c. අත් කරගත නොහැකි නිෂ්පාදන සංයෝගයක්.
d. ආර්ථික පසු පසුබෑමක්. (ලකුණු 01 බැගින්)

v. සමාජීය වෙළඳපල ආර්ථිකය සමාජවාදී වෙළඳපල ආර්ථිකයකින් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 04 යි.)

2)

i. වෙළඳපල සැපයුම් ශ්‍රිතය ගොඩනැගෙනුයේ ආයතනික සැපයුම් ශ්‍රිත වල තිරස් එකතුවෙනි. පහදන්න. (ලකුණු 04 යි.)

ii. 'සැපයුම් නීතිය' නිර්වචනය කොට ඒ කෙරෙහි බලපාන හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

iii. අවම මිලක ආර්ථික ප්‍රතිවිපාක දක්වන්න. (ලකුණු 04 යි.)

iv. ''ඉල්ලුමේ මිල නම්‍යතාව, ඉල්ලුම් වක්‍රයේ බෑවුමට සමාන වේ.'' ඉහත ප්‍රකාශය හා ඔබ එකගද? පහදන්න. (ලකුණු 04 යි.)

v. මිල ඉහළ යාමකදී සාමාන්‍ය භාණ්ඩයක, ගිෆන් භාණ්ඩයක, බාල භාණ්ඩයක, ආදේශන, ආදායම් හා මිල ප්‍රතිවිපාක හැසිරෙන ආකාරය පහදන්න. (ලකුණු 04 යි.)

3) එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සඅපයුම් සමීකරණ පහත පරිදි වේ.

Qd = 100- 2P

Qs = -20+3P

i. රජය මෙම වෙළඳපොළට මැදිහත් වී රු.10 ක උපරිම මිලක් නියම කළේ නම්,

අ) උපරිම මිලේදී ඉල්ලුම් නම්‍යතාවය හා සැපයුම් නම්‍යතාවය ගණනය කරන්න.

ආ) බාහිර පිරිවැයක් සහිත අවස්ථාවේදී පාරිභෝගික අතිරික්තය සොයාගන්න.

ඉ) උපරිම මිල පැනවීම නිසා නිෂ්පාදන අතිරික්තයේ හටගත් වෙනස්වීම කොපමණද?

ඊ) අහිමි වන සුභසාධනය කොපමණද? (ලකුණු 01 බැගින්)

ii. වමේ සිට දකුණට පහලට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක මිල ඉල්ලුම් නම්‍යතාවය හා ව්‍යාපාරික අයභාරය අතර ඇති සම්බන්ධතාව රූපසටහනක් ඇසුරෙන් දක්වන්න. (ලකුණු 04 යි.)

iii. සැපයුම් නම්‍යතාවයේ ස්වරූපය අනුව සහනාධාරයක් ලබා දුන් විට එහි වාසිය බෙදී යන අයුරු දක්වන්න. (ලකුණු 04 යි.)

iv. පහත සඳහන් භාණ්ඩ හඳුනාගන්න.

අ) ආදායම් ඉල්ලුම් නම්‍යතාවය = +0. 1

ආ) හරස් ඉල්ලුම් නම් නම්‍යතාවය = -2

ඉ) මිල ඉල්ලුම් නම් නම්‍යතාවය = +0. 5

ඊ) ආදායම් ඉල්ලුම් නම්‍යතාවය = -1. 5 (ලකුණු 01 බැගින්)

4)

i. නිෂ්පාදනය ආයතනයක කෙටිකාලීන පිරිවැය වක්‍රවල හැඩය සමග හීනවන ඵල නීතිය සම්බන්ධ වන්නේ කෙසේද? (ලකුණු 04 යි.)

ii. පූර්ණ තරගකාරී ආයතනයක් දිගු කාලයේදී ප්‍රාමාණික ලාභ පමණක් උපයන්නේ ඇයිදැයි පහදන්න. (ලකුණු 04 යි.)

iii. වෙළඳපල සමතුලිත අවස්ථාවකදී නිෂ්පාදන අතිරික්තය, පාරිභෝගික පැහැදම හා සංක්‍රාම ඉපයීම රූප සටහන් ඇසුරෙන් පහදන්න. (ලකුණු 03 යි.)

iv. ඒකධිකාරිය, ඒකාධිකාරී තරගයෙන් වෙනස් වන්නේ මන්දැයි පහදන්න. (ලකුණු 04 යි.)

v. පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක කෙටි කාලීන මුළු අයභාරය රු.10,000 කි. මෙම ආයතනයේ මුළු පිරිවැය හා මුළු ස්ථාවර පිරිවැය පිළිවෙලින් රු.12,000 ක් හා රු.4,000 ක් වේ.මෙම ආයතනය තවදුරටත් කෙටි කාලයේ නිරත වේදැයි පහදන්න. (ලකුණු 05 යි.)

5)

i. ව්‍යාපාර චක්‍රයක ප්‍රසාරණය ආර්ථික වෘද්ධියෙන් වෙනස් වුවක් ලෙස අප සලකන්නේ ඇයි? (ලකුණු 02 යි.)

ii. පහත දැක්වෙන ගනුදෙනු රටක දළ දේශීය නිෂ්පාදිතයට ඇතුලත් කර ගන්නවා ද නැද්ද යන්න පැහැදිලි කරන්න.

අ) විදේශයක නිෂ්පාදනය කරන ලද රුපියල් මිලියන දහයක් වටිනා ටින් කෑම සංචාරක හෝටලයක් විසින් මිලදී ගැනීම.

ආ) නිෂ්පාදන සමාගමක් අගනුවර සිසිල් බීම බෝතල් කිරීමේ කම්හලක් අලුතින් ඉදි කිරීම.

ඉ) ආයෝජකයෙකු විසින් ප්‍රධාන වාණිජ බැංකුවක රුපියල් මිලියන 30ක් වටිනා කොටස් මිලදී ගැනීම.

ඊ) පොත් ප්‍රකාශකයකු විසින් අලුත් පොතක පිටපත් විශාල සංඛ්‍යාවක් මුද්‍රණය කොට එයින් මෙම වර්ෂයේ අලෙවි නොවූ අතිරික්ත පිටපත් සංඛ්‍යාව සමාගමේ තොග වලට එකතු කිරීම. (ලකුණු 02 බැගින්)

iii. කල්පිත ආර්ථිකයක් පිළිබඳ සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දැක්වේ.

C = 100+ 0.8Y (පරිභෝජන ශ්‍රිතය)

I = 200 (පෞද්ගලික ආයෝජනය)

G = 75 (රජයේ මිලදීගැනීම්)

අ) මෙම ආර්ථිකය සඳහා ඉතුරුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න (ලකුණු 01 යි.)

ආ) ජාතික ආදායමේ සමතුලිත මට්ටම කොපමණද? (ලකුණු 02 යි.)

ඉ) මෙම ආර්ථිකයේ විභව නිමැවුම් මට්ටම රුපියල් බිලියන 2000කි. මෙහි රජයේ මිලදී ගැනීම් රුපියල් බිලියන 50 කින් ඉහළ නැංවූ විට - හෝ + නිමැවුම් පරතරයේ ප්‍රමාණය කොපමණ වේද? (ලකුණු 01 යි.)

iv. කල්පිත ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබ වෙත ලබා දී ඇතැයි උපකල්පනය කරන්න.

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 800 |
| පෞද්ගලික පරිභෝජන වියදම් | 3000 |
| ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් | 100 |
| ආණ්ඩුවේ මිලදී ගැනීම් | 900 |
| තොග වෙනස්වීම් | -50 |
| අපනයන | 450 |
| ආනයන | 600 |
| නිෂ්පාදනය මත ශුද්ධ බදු | 150 |

වෙළඳපල මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න. (ලකුණු 04 යි.)

v. ජාතික ගිණුම්කරණයේ පිරිවැය දක්වන්න. (ලකුණු 02 යි.)

## <u>"ආ" උප කොටස</u>

6)

i. ශ්‍රී ලංකාවේ ජීවන වියදම් මිනුමක් වශයෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයට වඩා ජාතික පාරිභෝගික මිල දර්ශකයයේ ඇති වාසි කවරේද? (ලකුණු 02 යි.)

ii. උද්ධමනයේ පිරිවැය කවරේද? (ලකුණු 02 යි.)

Iii. මුදල්, මුදල් ආදේශක, ආසන්න මුදල් හා විද්‍යුත් මුදල් යනාදිය සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

iv.මහ බැංකුව මූල්‍ය තැරැව්කාර ආයතනයකින් රු.100,000 පිළිනපතක් මිලදී ගන්නා බවත්,ඒ සඳහා තැරැව්කාර ආයතනයට ගෙවනු ලබන මුදල් බැංකු පද්ධතියක ඇති එක්තරා වාණිජ බැංකුවක තැන්පත් කරන බවත් සලකන්න.

a. මෙම ගනුදෙනුව මුදල් සැපයුම කෙරෙහි ඇති කරන බලපෑම කුමක්ද?
b. සංචිත අවශ්‍යතාවය 20% ක් වේ නම් මහ බැංකුවේ ඉහත ක්‍රියාව කරණකොට ගෙන උපරිම වශයෙන් අතිරේක ණය කොපමණ ප්‍රමාණයක් ලබා දිය යුතුද?
c. සංචිත අවශ්‍යතාවය 20% ක් වේ නම් මහ බැංකුවේ ඉහත ක්‍රියාව කරණකොට ගෙන සමස්ත බැංකු පද්ධතියටම උපරිම වශයෙන් වැඩි කළ හැකි තැන්පතු ප්‍රමාණය කොපමණද?
d. එබඳු තැන්පතු ප්‍රසාරණයක් සිදු වෙතැයි ඔබ අපේක්ෂා කරන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 02 බැගින්)

v. ශ්‍රී ලංකාවේ අන්තර් බැංකු එක්ෂණ ණය අරමුදල් වෙළඳපොලෙහි පොලී අනුපාතික පාලනය කිරීම සඳහා මහ බැංකුව නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව මෙහෙය වන්නේ කෙසේද? (ලකුණු 04 යි.)

7)

i. 'පෞද්ගලික භාණ්ඩ බාහිර ප්‍රතිලාභයක් ඇති කල විට ශුභ සාධක භාණ්ඩ වන අතර බාහිර පිරිවැයක් ඇති කළ විට අවගුණ භාණ්ඩ වේ' ඉහත ප්‍රකාශයට ඔබ එකගද? පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

ii. ආණ්ඩුවේ අසමත්වීම යනු කුමක්ද? ඒ කෙරෙහි බලපාන සාධක මොනවාද? (ලකුණු 02 යි.)

iii. ''කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමෙහිලා බාහිර පිරිවැයක් හටගනු ලබන අවස්ථාවක, වෙළෙඳපොළ මගින් ලබාදෙනු ලබන විසඳුම් සමාජීය වශයෙන් ප්‍රශස්ත විසඳුමක් නොවේ'' යෝග්‍ය ප්‍රස්තාර සටහනක් ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

iv. පහත සඳහන් සංකල්ප කෙටියෙන් පහදන්න.

අ) වර්තන ගිණුමේ ශේෂය


ආ) ශුද්ධ මූල්‍ය හිඟය

ඉ) සමස්ත ගිනුමේ ශේෂය (ලකුණු 02 බැගින්)

v. ''ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කටයුතු ඛේදනීය තත්ත්වයක පවතී'' (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය). ශ්‍රී ලංකාවේ වර්තමාන රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ දක්නට ඇති ප්‍රධාන දුර්වලතා හඳුන්වන්න. (ලකුණු 04 යි.)

8)

i. ජංගම දුරකථන සහ පා පැදි නිෂ්පාදනය කරනු ලබන A සහ B යන රටවල් දෙකෙහි නිෂ්පාදන හැකියා වක්‍ර පහත රූප සටහනින් දැක්වේ.




අ) එක් එක් රටෙහි පාපැදියක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය කොපමණද? (ලකුණු 02 යි.)

ආ) ජංගම දුරකථන නිෂ්පාදනයේ සාපේක්ෂ වාසි ඇත්තේ කවර රටකට ද? (ලකුණු 01 යි.)

ඉ) දෙරටටම වාසිදායක වෙළඳාමක් හට ගැනීම සඳහා ජංගම දුරකථන හා පාපැදි අතර හුවමාරු අනුපාතය කුමක් විය යුතුද? (ලකුණු 02 යි.)

ii. ද්විත්ව සටහන් මූලධර්මය යොදා ගනිමින් පහත සඳහන් ගනුදෙනු ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයෙහි ඔබ වාර්තා කරන්නේ කෙසේද?

අ) චීන ආයෝජකයකු විසින් ඩොලර් මිලියන 10 ක කොටස් කොළඹ සුරැකුම්පත් හුවමාරුවෙන් මිලයට ගැනීම.

ආ) මැදපෙරදිග සේවය කරන ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක් ඩොලර් 500 ක මුදලක් ලංකාවේ සිටින තම දෙමවුපියන් වෙත එවීම.

ඉ) ශ්‍රී ලාංකික බැංකුවක් විදේශීය මූල්‍ය වෙළඳපලවල පිළිනපත් අලෙවි කොට ඩොලර් මිලියන හතළිහක් ලබාගැනීම.

උ) ලෝකයේ ශීඝ්‍රයෙන් අලෙවි වන පොතක් පරිවර්තනය කොට ශ්‍රී ලංකාවේ අලෙවි කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශන සමාගමක් ඇමරිකානු ප්‍රකාශන සමාගමකට ඩොලර් පන්දාහක් ගෙවා එහි ප්‍රකාශන අයිතිය ලබා ගැනීම. (ලකුණු 01 බැගින්)

iii. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රධාන අරමුණු දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

iv. පාවෙන විනිමය අනුපාතික ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රුපියලේ බාහිර අගය ඇමෙරිකානු ඩොලර්වලින් තීරණය වන ආකාරය පෙන්නුම් කිරීම උචිත ප්‍රස්තාර සටහනක් අඳින්න. මෙම විදේශ විනිමය වෙළෙඳපොලෙහි ඉල්ලුම් වක්‍රය පහලට සහ සැපයුම් වක්‍රය ඉහලට බෑවුම් වන්නේ ඇයිද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

v. බහු පාර්ශවීය මූල්‍ය ආයතන යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03 යි.)

9)

i. සංවර්ධනය, තිරසාර සංවර්ධනය හා මානව සංවර්ධනය යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

ii. ජාත්‍යන්තර දරිද්‍රතා ඉම නිර්වචනය කරන්න. වර්තමානයේ ඒවායේ අගයන් කවරේද? (ලකුණු 04 යි.)

iii. සංවර්ධන මිනුමක් වශයෙන් මානව සංවර්ධන දර්ශකයේ ප්‍රබලතා හා දුබලතා දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

iv. ජනගහන වියපත් වීම නිසා ශ්‍රී ලංකාව මුහුණ පා සිටින ප්‍රධාන ආර්ථික අභියෝග කවරේද? (ලකුණු 04 යි.)

10)

i. ශ්‍රී ලංකාව පහළ මැදි ආදායම්ලාභී රටක සිට ඉහළ මැදි ආදායම්ලාභී රටක තත්ත්වය කරා ඉහළ නංවා ගැනීමේ දී මුහුණ දෙන ප්‍රධාන අභියෝග කවරේද? (ලකුණු 05 යි.)

ii. 1977 දී ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබූ ආර්ථික නිර්බාධීකරන ප්‍රතිසංස්කරණ වල ප්‍රධාන අංග වූයේ කවරදැද? (ලකුණු 04 යි.)

iii. ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහිලා යොදාගත හැකි උපක්‍රමයක් වශයෙන් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයේ (ppp) වාසි කවරේද? (ලකුණු 05 යි.)

iv. ''නිදහස් ලබා ගැනීමෙන් පසු කාලය තුළ ශ්‍රී ලංකාව අනුගමනය කොට ඇති ආර්ථික ප්‍රතිපත්ති, ආරක්ෂණවාදී සහ නිර්බාධවාදී මුලෝපායන් අතර දෝලනය වීමක් පෙන්නුම් කරයි'' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)